# *ශ්‍රී ලාංකේය චිත්‍ර කලාව තුළ ස්ත්‍රී නිරූපණය: 20 වන හා 21වන සියවස තුළ වූ නිර්මාණ ඇසුරින්*

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*යූ.ඩී.පී.ටී.කරුණාරත්න*[1]
*ධම්මිකා කුමාරි මනතුංග*[2]

**සංක්ෂේපය**

නිශ්චිත සන්නිවේදන රටාවක් හඳුනානොගත් කාලයක සිට මානවයා තම අදහස් හා හැඟීම් මෙන්ම මානව ක්‍රියාවලියේ ම රිද්මය, රටාව, ජීවය හා සාරය විදහා දක්වනු වස් යොදාගැනුණ සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් "සිතුවම" හඳුන්වා දියහැක. මානව සංස්කෘතියේ ආදිතම යුගයේ පටන් නූතන යුගය දක්වා මිනිසාගේ මේ කලා ප්‍රකාශනය පරිණාමය වී ඇත. මෙහිදී 20 වන හා 21 වන සියවස් හි නිර්මාණය කළ සිතුවම් පාදකකරගෙන ශ්‍රී ලාංකේය නූතන චිත්‍ර කලාව තුළ ස්ත්‍රී නිරූපණය සඳහා සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සාධක හේතුවූවාද ? යන්න මූලික අරමුණ කරගනිමින් මෙම පර්යේෂණය සිදුකර ඇත. යුරෝපයේ නූතන සිතුවම් කෙරෙහි අවධානය යොමුකර පසුව ලාංකේය නූතන ශිල්පීන් කාන්තාව නැමති වස්තුවිෂය චිත්‍රය නැමති භාෂාවට පරිවර්තනය කළ ආකාරය මින් අවබෝධ කර ගතහැක. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සිතුවම් යොදාගෙන ඇති අතර ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කරනු ලැබිණි. සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ වත්මන් ආචාර්යවරුන්ගේ සිතුවම් අධ්‍යයනය කළ අතර ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡා කරමින් තොරතුරු ලබාගැනුණි. මෙහිදී ලාංකේය නූතන සිතුවම් යටත්විජිතකරණ පසුබිම යටතේ සමාජ, ආර්ථික, දේශපාලන සාධක මත ස්ත්‍රී නිරූපණය කිරීම හා ලාංකේය දෘශ්‍ය කලාවේ පසුබිම පිළිබඳ කරුණු ඉදිරිපත් කරනු ලැබේ. ගුහා සිතුවම් කෙරෙහි මූලිකවම අවධානය යොමු නොකර ඇති නමුත් , මිනිසා ශිෂ්ටාචාරගත වීමත් සමඟ ස්ත්‍රීය සශ්‍රීකත්වයේ දෙවඟන මෙන්ම මව් දෙවඟන වශයෙන්ද වන්දනාමාන කිරීමට පෙළඹී ඇත. මේ නිසාම ග්‍රීකයන් විසින් පුනරුද සමයේ වීනස් වැනි කලාකෘතීන් මඟින් පරිසමාප්ත ස්ත්‍රීරුවට දේවත්වය ආරූඪ කරනලදී. නමුත් යුරෝපයේ ඇති වූ යුධමය හා දේශපාලන, ආර්ථික රටාවේ වෙනස්කම් මත එතෙක් ශාස්ත්‍රාලීය සීමාවෙන් හෙම්බත් වූ කලාකරුවෝ ස්වාධීනව ඔවුන්ට ම ආවේණික වස්තුවිෂයන් මඟින් ස්ත්‍රී රූව නිර්මාණය කළහ. 19වන සියවස අගභාගයේ දී "නූතන චිත්‍ර කලාව" නම් සංකල්පය ප්‍රථමවරට ග්‍රීකයන් විසින් ලෝකයට හඳුන්වාදෙන ලදී. එය යුරෝපයට පමණක් සීමානොවී විවිධ සංකල්පයන් සහිත නූතන චිත්‍ර කලාව ආසියාවේද ව්‍යාප්ත විය. අධිරාජ්‍යවාදී පාලනයේ මූලධර්මයක් වශයෙන් නව අධ්‍යාපන ක්‍රමයන් හා දේශපාලන ව්‍යුහයන් , ශ්‍රාස්ත්‍රාලීය චිත්‍ර කලාව යන කරුණු යුරෝපීය අධිරාජ්‍යවාදය යටතේ ආසියාවේ ස්ථාපිත වී තිබුණි. මෙම පසුබිම යටතේ උපස්ථිතිවාදය , ඝණිකවාදය ආදි විවිධ කලා සංකල්පයන් ඔස්සේ මෙය විකාශය වී ඇත. විශේෂයෙන් 1943 ශිල්පීන් නවදෙනෙකුගෙන් සමන්විත 43 කණ්ඩායම බිහිවීම ලංකාවේ නූතන චිත්‍ර කලාවේ වැදගත් සන්ධිස්ථානයකි. ඔවුන් අධිරාජ්‍යවාදි වික්ටෝරියානු කලාවට අභියෝග කරමින් ස්වාධීනව කටයුතු කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස නූතන සිතුවම්කරුවා ස්ත්‍රී නිරූපණයන් තම කැන්වසය මත පින්සල් පහරින් නිම කරනු ලැබුවේ ඔවුන්ටම ආවේණික කලා රීතියක් තුළිනි. සමාජ රටාවන්හි වෙනස්වීම් මත සිතුවම් කලාව නව මඟකට වෙනස් වූ බව මින් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :*ශ්‍රී ලංකාව , නූතන චිත්‍ර කලාව , ස්ත්‍රී නිරූපණය***

1 ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sumuduprarthana92@gmail.com

2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය